සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் தவணைப் பரீட்சை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 12 | විෂයය / பாடம் / Subject: ලංකා ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: |

උපදෙස්

- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.
- II කොටස **A, B** හා **C** ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
- **A** කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක්වත්** තෝරාගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් I කොටස සමග සපයා ඇත.

## A කොටස

01) පහත දක්වා ඇති සියලුම ස්ථාන ඔබට සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කොට නම් කරන්න.

1. මාගම
2. වලවේ ගඟ
3. කලා වැව
4. හුරුලු වැව
5. මිහින්තලය
6. මිනිපේ අමුණ
7. ඌරා තොට
8. කුරුණෑගල
9. පොළොන්නරුව
10. එලිෆන්ට්පාස් (අලිමංකඩ)
11. බුන්දල
12. කළුගඟ

**(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 බැගින්)**

## B කොටස

02) ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර භූගෝලීය සාධක ඉතිහාසය හැඩගැස්වීමට දැක්වූ දායකත්වය පහත මාතෘකා ඔස්සේ පරීක්ෂා කරන්න.

i. මධ්‍යම කඳුකරය
ii. ගංගා සහ ගංගා නිම්න
iii. ස්වාභාවික වරායන් (ලකුණු 16)

03 මහසෙන් රාජ්‍ය සමය අවසානය දක්වා ඉතිහාසය හැදෑරීමට ඇති ප්‍රමුඛතම වංසකතාව මහ වංසයයි.

i. මහා වංසයේ කතුවරයා නම් කරන්න. (ලකුණු 01)

ii. මහාවංසයට පදනම් කරගෙන ඇති මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

iii. මහවංසයේ එන තොරතුරු පුරාවිද්‍යාත්මක මුලාශ්‍ර මගින් සනාථ වන ආකාරය සැලකිල්ලට ගනිමින් ඉහත කියමන සනාථ කරන්න. (ලකුණු 13)

04 කාවන්තිස්ස රජුගේ විචක්ෂණශීලී රාජ්‍ය උපක්‍රම දුටුගැමුණු රජුගේ ජයග්‍රණයට පදනම දැමීය.

i. රුහුණු රජ පෙළපතේ ආරම්භක පාලකයා නම් කරන්න. (ලකුණු 01)

ii. දුටුගැමුණු රජු එළාර ජයගැනීමට ගිය ගමන් මාර්ගය විස්තර කරන්න. (ලකුණු 04)

iii. ඉහත කියමන විස්තරාත්මකව විමසන්න. (ලකුණු 11)

05) අනුරාධපුර රාජධානියේ ආර්ථික තත්ත්වය පහත මාතෘකා ඔස්සේ පරීක්ෂා කරන්න.

i. වාරි තාක්ෂණයේ ක්‍රමික වර්ධනය (ලකුණු 08)

ii. වාරි කර්මාන්තය මත පදනම් වූ කෘෂි කර්මාන්තය (ලකුණු 08)

## C කොටස

06) පළමු වන විජයබාහු රජු පොළොන්නරු යුගයේ ශ්‍රේෂ්ඨතම පාලකයා ලෙස සලකන්නේ විදේශ ආක්‍රමණවලින් රට මුදවා ගත් නිසාය

i. අනුරාධපුර යුගය පිරිහීමට බලපෑ ආක්‍රමණ එල්ල කළ චෝල පාලකයන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)

ii. පළමු විජයබාහු රජුගේ මව සහ පියා නම් කරන්න. (ලකුණු 02)

iii. ඉහත කියමන විචාරාත්මකව විමසන්න. (ලකුණු 12)

07) රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමට තුඩු දුන් සාධක පරික්ෂා කරන්න. (ලකුණු 16)

08) දෙවන පරාක්‍රමබාහු රජු දඹදෙණිය යුගයේ ශ්‍රේෂ්ඨතම පාලකයා ලෙස සැලකීමට බලපෑ හේතු සාධක විමසන්න. (ලකුණු 16)

09) පහත මාතෘකාවලින් **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. වසභ රජතුමා

ii. කෝට්ටේ යුගයේ සාහිත්‍යය

iii. ක්‍රි.ව 05 වන සියවස දක්වා ලංකාවට එල්ල වූ ආක්‍රමණ

iv. ගම්පොළ රාජධානිය

(ලකුණු 08 x 2=16)